සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# අවසාන වාර පරීක්ෂණය 2022

**10 ශ්‍රේණිය 60 - ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය (නව නිර්දේශය) - I කාලය පැය 01 යි.**

නම/ විභාග අංකය:

*උපදෙස් :*

- සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
- අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී (1), (2), (3), (4) යන පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැලපෙන හෝ පිළිතුර තෝරා ගන්න.
- ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතරින් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ ( × ) ලකුණ යොදන්න.

01. ලාභ අපේක්ෂිත ව්‍යාපාරවල පොදුවේ දැකිය හැකි ව්‍යාපාර අරමුණක් වන්නේ,

(1) භාණ්ඩ හා සේවාවල ගුණත්වය ඉහළ නැංවීම.

(2) පාරිභෝගික තෘප්තිය ඉහළ නැංවීම.

(3) රැකියා උත්පාදනය

(4) සේවක සුභ සාධනය. (..........)

02. ජීවත් වීම සඳහා මිනිසා විසින් අනිවාර්යයෙන් ම සපුරා ගත යුතු දෑ මිනිස් අවශ්‍යතා ලෙස හඳුන්වයි. අවශ්‍යතාවල ලක්ෂණයක් වන්නේ,

(1) අසීමිත වීම. (2) විවිධ වීම. (3) සීමිත වීම. (4) සංකීර්ණ වීම. (..........)

03. පහත දැක්වෙන වගුවේ X තීරුවේ නිෂ්පාදන සම්පත් දැක්වේ. Y තීරුවේ එයට අදාළව නිදසුන් හෝ ලක්ෂණයක් දැක්වේ (පිළිවෙලින් ම නොවේ.)

| X | Y |
|---|---|
| 1. භූමිය | A. ගොඩනැගිලි, රථ වාහන |
| 2. ශ්‍රමය | B. ඛනිජ සම්පත්, වන සම්පත් |
| 3. ප්‍රාග්ධනය | C. අවදානම් දැරීම, නව්‍යතා සම්පාදනය |
| 4. ව්‍යවසාය | D. ගණකාධිකාරී, කළමනාකරුවෝ |

X තිරුවේ සම්පත් Y තීරුවේ සමග නිවැරදිව ගැලපූ විට පිළිතුර වන්නේ,

(1) 1D, 2C, 3B, 4A (2) 1A, 2C, 3D, 4B

(3) 1C, 2B, 3A, 4D (4) 1B, 2D, 3A, 4C (..........)

04. ව්‍යාපාරයකට සම්පත් සපයන පුද්ගලයෝ වන්නේ,

(1) සැපයුම්කරුවෝ (2) අයිතිකරුවෝ

(3) ගනුදෙනුකරුවෝ (4) කළමනාකරුවෝ (..........)

05. ව්‍යාපාර කාර්යය ඉටු කරන පුද්ගලයෝ සේවකයන් වෙති. සේවක අරමුණක් වන්නේ,

(1) තරගයට මුහුණ දීම. (2) ආයෝජන පිළිබඳ තීරණ ගැනීම.

(3) ප්‍රමාණවත් ලාභයක් ලැබීම. (4) රැකියා සුරක්ෂිත බව (..........)

06. පහත දැක්වෙන වගුවේ X තීරුවේ ව්‍යාපාර කෙරෙහි ඇල්මැති පාර්ශව සඳහන් වේ. Y තීරුවේ අරමුණු සඳහා නිදසුන් දැක්වේ.

| X | Y |
|---|---|
| 1. ප්‍රජාව | A. රැකියා උත්පාදනය |
| 2. රජය | B. රැකියා වර්ධනය හා තෘප්තිය |
| 3. කළමනාකරුවෝ | C. ණය සැපයීම හා අයකර ගැනීම |
| 4. මූල්‍ය ආයතන | D. සමාජ සුභ සාධනය |

X තීරුවේ පාර්ශව Y තීරුව සමග ගැලපූ විට ලැබෙන නිවැරදි පිළිතුර තෝරන්න.

(1) 1D, 2A, 3B, 4C (2) 1D, 2C, 3A, 4B
(3) 1B, 2A, 3C, 4D (4) 1B, 2C, 3D, 4A (..........)

07. ව්‍යාපාර පරිසරය ප්‍රධාන වශයෙන් කොටස් දෙකක් යටතේ වර්ග කළ හැකි අතර එයින් බාහිර බලවේග පමණක් ඇතුළත් පිළිතුර වන්නේ,

(1) තරගකරුවෝ, අයිතිකරුවෝ (2) සැපයුම්කරුවෝ, සේවකයෝ
(3) තරගකරුවෝ, ගනුදෙනුකරුවෝ (4) කළමනාකරුවෝ, සැපයුම්කරුවෝ (..........)

08. යම් රටක රජයක් විසින් යටිතල පහසුකම් සංවර්ධනය සඳහා වාර්ෂික අයවැය මගින් මුදල් වෙන් කිරීම කුමන ව්‍යාපාර පරිසර බලවේගයට අයත් වේ ද?

(1) දේශපාලන පරිසරය (2) නෛතික පරිසරය
(3) ආර්ථික පරිසරය (4) ගෝලීය පරිසරය (..........)

09. තාක්ෂණික පරිසරය සීඝ්‍රයෙන් වර්ධනයට වඩාත් හේතු වන්නේ,

(1) නැනෝ තාක්ෂණය හා ඩිජිටල් තාක්ෂණය (2) නව සොයාගැනීම් හා නව නිර්මාණ
(3) ව්‍යාපාර කටයුතු හා පුද්ගල ජීවන රටාව (4) පරිගණක තාක්ෂණය හා අන්තර්ජාලය (..........)

10. ආදායම් ව්‍යාප්තිය වඩාත් නිවැරදිව නිර්වචනය කර ඇත්තේ,

(1) රැකියා නියුක්ත වීමෙන් ලැබෙන ආදායම.
(2) යම් වැටුපකට ලබා ගත හැකි භාණ්ඩ හා සේවා ප්‍රමාණය
(3) උද්ධමනය හා පොලී අනුපාතය අතර සම්බන්ධතාව
(4) රටක ජාතික ආදයම් එරට ජනතාව අතර බෙදී ඇති ආකාරය (..........)

11. සම්බාධක හේතුවෙන් ලෝක තෙල් සැපයුම සීමා වීම හා බොරතෙල් මිල ඉහළ යාම අයත් වන්නේ,

(1) ආර්ථික පරිසරයටය. (2) දේශපාලන පරිසරයටය.
(3) ගෝලීය පරිසරයටය. (4) නෛතික පරිසරයටය. (..........)

12. ව්‍යාපාරයක අභ්‍යන්තර පරිසරය අධ්‍යයනයේ දී හඳුනාගන්නා ව්‍යාපාරයට හිතකර සාධක (1) ........................ ලෙසත්, අහිතකර සාධක (2) ..............................ලෙසත් හඳුන්වයි.
ඉහත ප්‍රකාශයේ, 1, 2 හිස්තැන්වලට සුදුසු යෙදුම් නිවැරදිව දක්වා ඇති පිළිතුර තෝරන්න.

(1) ශක්තීන්, තර්ජන (2) අවස්ථා, තර්ජන
(3) අවස්ථා, දුර්වලතා (4) ශක්තීන්, දුර්වලතා (..........)

13. හවුල් ව්‍යාපාරයක ආරම්භක ප්‍රාග්ධනය රු. 1 000 /= ට වඩා වැඩිනම් එය ලිඛිත ගිවිසුමකින් ආරම්භ කළ යුතු බව ප්‍රකාශ වන්නේ,

(1) 1890 හවුල් ව්‍යාපාර ආඥා පනත යටතේ ය.
(2) 1918 අංක 06 දරන ව්‍යාපාර නාම ආඥා පනත යටතේ ය.
(3) 1840 අංක 07 දරන වංචා වැළැක්වීමේ ආඥා පනත යටතේ ය.
(4) 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ ය.

14. පූර්ණ රාජ්‍ය හිමිකාරීත්වය සහිත ව්‍යාපාර සංවිධානය වනුයේ,

(1) රාජ්‍ය දෙපාර්තමේන්තු (2) රාජ්‍ය සමාගම්
(3) රාජ්‍ය සංස්ථා (4) සමූපකාර සමිති (..........)

15. ඒක පුද්ගල ව්‍යාපාරයක් එහි නාමය ලියාපදිංචිය සඳහා අයදුම්පත් ඉදිරිපත් කළ යුත්තේ ආරම්භ කර,
(1) දින 07 ක් ඇතුළතය. (2) දින 14 ක් ඇතුළතය.
(3) දින 25 ක් ඇතුළතය. (4) දින 30 ක් ඇතුළතය. (..........)

16. පහත සඳහන් පරිගණක මෘදුකාංග අතුරෙන් ගිණුම්කරණ මෘදුකාංගයක් නොවන්නේ කුමක් ද?
(1) Sage (2) MYOB (3) MS Word (4) ACC Pac (..........)

17. ව්‍යාපාර ආයතනයක ජංගම වත්කම් පමණක් දැක්වෙන පිළිතුරු තෝරන්න.
(1) ලී බඩු, ණය ගැතියෝ, බැංකු ශේෂය (2) බඩු තොගය, මුදල්, ණය ගැතියෝ
(3) මුදල්, බැංකු ශේෂය, බැංකු ණය (4) ණය හිමියෝ, බැංකු ශේෂය, බඩු තොගය (..........)

18. අයිතිකරුවන් යොදන ප්‍රාග්ධනය නිසා හිමිකමෙහි සිදුවන වැඩිවීම් හැර හිමිකමෙහි සිදුවන අනෙකුත් වැඩිවීම්,
(1) ගැනිලි ලෙස හඳුන්වයි. (2) අමතර ප්‍රාග්ධනය ලෙස හඳුන්වයි.
(3) ආදායම් ලෙස හඳුන්වයි. (4) වත්කම් ලෙස හඳුන්වයි. (..........)

19. අයිතිකරුගේ පෞද්ගලික මුදලින් ණය හිමියන් පියවූ විට,
(1) වත්කම් අඩුවේ, වගකීම් අඩුවේ. (2) හිමිකම් අඩුවේ, වත්කම් අඩුවේ.
(3) හිමිකම් වැඩි වේ, හිමිකම් අඩු වේ. (4) හිමිකම් වැඩි වේ, වගකීම් අඩු වේ. (..........)

20. සමිතගේ ව්‍යාපාරයේ 2022 / 1 / 1 ට ගිණුම්කරණ සමීකරණය පහත පරිදි වේ.

වත්කම් = හිමිකම් + වගකීම්

500 000 = 350 000 + 150 000

රු. 18 000 /= ක බැංකු ණය පොළී ගෙවීමෙන් පසු නිවරදි ගිණුම්කරණ සමීකරණය දැක්වෙන පිළිතුර තෝරන්න.
(1) 518 000 = 368 000 + 150 000 (2) 482 000 = 350 000 + 132 000
(3) 482 000 = 332 000 + 150 000 (4) 500 000 = 368 000 + 132 000 (..........)

21. අතීත ගනුදෙනුවක ප්‍රතිඵලයක් ලෙස ඇති වූ ව්‍යාපාරය විසින් ගෙවිය යුතු වටිනාකම හඳුන්වනුයේ,
(1) වගකීම් (2) වත්කම් (3) හිමිකම් (4) වියදම් (..........)

22. ව්‍යාපාරයක ආයෝජන පොළී ආදායම් ලැබීම, කුමන ශීර්ෂයක් යටතේ වර්ගීකරණය වියයුතු ද?
(1) ගැනිලි (2) ආදායම් (3) වියදම් (4) වත්කම් (..........)

23. අචිනි විසින් උත්සව අවස්ථා කළමණාකරණය සඳහා රු. 300 000 ක මුදලක් හා රු. 200 000 ක බැංකු ණය මුදලක් යොදවා ව්‍යාපාරයක් ආරම්භ කරන ලදී. මෙම ගනුදෙනුවට අදාළ නිවැරදි ගිණුම්කරණ සමීකරණය වන්නේ,

| | වත්කම් | = | හිමිකම් | + | වගකීම් |
|---|---|---|---|---|---|
| (1) | 500 000 | = | 200 000 | + | 300 000 |
| (2) | 500 000 | = | 300 000 | + | 200 000 |
| (3) | 300 000 | = | 300 000 | | |
| (4) | 200 000 | = | | + | 200 000 |

(..........)

24. කොමිස් ආදායමක් ලැබීම බලපානු ලබන්නේ,
(1) වත්කම් හා වගකීම් වලට (2) වත්කම් හා වියදම් වලට
(3) වියදම් හා වගකීම් වලට (4) වත්කම් හා හිමිකම් වලට (..........)

25. රෙදිපිළි ව්‍යාපාරයක සිදු වූ ගණුදෙනු පහත දැක් වේ.
A සඳුනිට ණය පදනම මත රෙදිපිළි විකුණුම් රු. 20 000.
B සඳුනිගෙන් රු. 15 000 ක මුදලක් ලැබීම.
C රු. 5 000 ක් බොල්ණය ලෙස කපා හැරීම.

ඉහත ගනුදෙනු වලට අදාල මූලාශ්‍ර ලේඛන නිවැරදිව දක්වා ඇත්තේ,
(1) විකුණුම් ජ'නලය, මුදල් පොත, පොදු ජ'නලය
(2) ඉන්වොයිසිය, වවුචරය, ලදු පොත
(3) විකුණුම් ජ'නලය, මුදල් පොත, ගැනුම් ජ'නලය
(4) ඉන්වොයිසිය, ලදුපත, ජ'නල් වවුචරය (..........)

26. පහත දැක්වෙන ගනුදෙනු අතරින් පොදු ජ'නලයේ සටහන් කරන ගනුදෙනුව කුමක් ද?
   (1) වෙළඳ භාණ්ඩ ණයට ගැනීම.
   (2) රු. 40 000 ක යන්ත්‍ර මිල දී ගැනීම.
   (3) වෙළඳ භාණ්ඩ ණයට විකිණීම.
   (4) ව්‍යාපාරයේ ප්‍රයෝජනය සඳහා යන්ත්‍රයක් ණයට ගැනීම. (..........)

27. විරාජ් විසින් තම බැංකු ජංගම ගිණුම සඳහා රු. 15 000 ක බැංකු අයිරා පහසුකමක් ලබාගෙන ඇත. බැංකුව විසින් විරාජ්ගේ රක්ෂණ වාරිකය ලෙස රු. 10 000 ක් ගෙවූ අතර එම අවස්ථාවේ දී බැංකු ජංගම ගිණුමේ වාසිදායක ශේෂය රු. 6 000 කි. විරාජ් විසින් බැංකුවෙන් ලබාගත් බැංකු අයිරා වටිනාකම වන්නේ,
   (1) රු. 15 000 (2) රු. 10 000 (3) රු. 6 000 (4) රු. 4 000 (..........)

28. වින්දාගේ ව්‍යාපාරයේ 2022. 08. 31 දිනට බැංකු ජංගම ගිණුමේ ශේෂයේ රු. 44 000 කි. එදිනට බැංකු ප්‍රකාශයේ ශේෂයේ සමග බැංකු ජංගම ගිණුමේ ශේෂය සමාන නොවිනි. එම වෙනසට හේතු පහත දක්වා ඇත.
   A ඉදිරිපත් නොවූ චෙක්පත් රු. 5 000
   B බැංකු ගාස්තු රු. 2 000
   C සෘජු ප්‍රේෂණ රු. 8 000
   D නිකුත්කල නමුත් අගරු වූ චෙක්පත් රු. 9 000
   සංශෝධිත මුදල් පොතේ ශේෂය වන්නේ,
   (1) රු. 42 000 (2) රු. 50 000 (3) රු. 59 000 (4) රු. 52 000 (..........)

29. බැංකු ප්‍රකාශනයට අනුව ශේෂය වන්නේ,
   (1) රු. 64 000 (2) රු. 48 000 (3) රු. 57 000 (4) රු. 52 000 (..........)

30. ව්‍යාපාරයක ලී බඩු ගිණුම ............................ ගිණුමකි. ගැණුම් ගිණුම .......................... ගිණුමකි.
   (1) වත්කම්, වියදම් (2) වියදම්, ආදායම්
   (3) වියදම්, හිමිකම් (4) වත්කම්, හිමිකම් (..........)

31. කවිඳු රෙදි පිලි අලෙවිසැලක හිමිකරුවෙකු වන අතර ඔහුගේ මිතුරෙකු වන අවිඳුට රු. 10 000ක රෙදි තොගයක් ණයට විකුණා ඇත. එම ණය පියවීමේ දී අවිඳුට 10% ක වට්ටමක් දෙන ලදී.
   කවිඳු ව්‍යාපාරය මෙම වට්ටම ගිණුම්ගත කිරීමේ දී,
   (1) දුන් වට්ටම් ගිණුම රු. 1 000 ක් හර කරයි. (2) දුන් වට්ටම් ගිණුම රු. 1 000 ක් බැර කරයි.
   (3) ලද වට්ටම් ගිණුම රු. 1 000 ක් හර කරයි. (4) ලද වට්ටම් ගිණුම රු. 1 000 ක් බැර කරයි. (..........)

- එක්තරා ව්‍යාපාරයක 2022 සැප්තැම්බර් මාසයේ සුළු මුදලින් කළ වියදම රු. 13 350 ක් විය. 2022 සැප්තැම්බර් 01 දින ශේෂය රු. 300 ද 2022 සැප්තැම්බර් 30 දින සුළු මුදල් ශේෂය රු. 1 650 ක් ද විය.
  **ඉහත තොරතුරු ඇසුරින් 32 හා 33 ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.**

32. එම ව්‍යාපාරයේ සුළු මුදල් අග්‍රිමය වනුයේ,
   (1) රු. 13 000 (2) රු. 15 000 (3) රු. 13 650 (4) රු. 15 300 (..........)

33. එම ව්‍යාපාරයේ 2021 ඔක්තෝම්බර් 01 දින ප්‍රතිපූරණය කළ යුතු මුදල වනුයේ,
   (1) රු. 15 300 (2) රු. 15 000 (3) රු. 13 650 (4) රු. 13 050 (..........)

34. ගයාන්ගේ ව්‍යාපාරයේ අගෝස්තු මාසය සඳහා පිලියෙළ කළ ගැණුම් ජ'නලය පහත දැක්වේ.

ගැණුම් ජ'නලය

| දිනය | ඉ. අ. | සැපයුම්කරු | වටිනාකම | ලෙ. පි. |
|---|---|---|---|---|
| 8 / 25 | 131 | ශලනි | 75 000 | |
| A | | B | 75 000 | |

   ඉහත A හා B ස්ථාන වලට යෙදිය යුතු නිවැරදි යෙදුම් දැක්වෙන පිළිතුර වනුයේ,
   (1) 8 / 31 ගැණුම් ගිණුමට බැර කළා. (2) 8 / 31 ගැණුම් ගිණුමට හර කළා.
   (3) 8 / 25 ගැණුම් ගිණුමට හර කළා. (4) 8 / 25 ගැණුම් ගිණුමට බැර කළා. (..........)

35. විකුණුම් ජ'නලයක සටහන් කළ ගනුදෙනු ලෙජරයට පිටපත් කිරීමේ දී,
(1) අදාළ ණය හිමි ගිණුම් වලට හර කරයි. (2) අදාළ ණය හිමි ගිණුම් වලට බැර කරයි.
(3) අදාළ ණය ගැති ගිණුම් වලට හර කරයි. (4) අදාළ ණයගැති ගිණුම් වලට බැර කරයි. (..........)

36. 2022. 09. 10 දින සමීර තම ව්‍යාපාරයේ ප්‍රයෝජනය සඳහා රු. 100 000 ක් වටිනා වානේ අල්මාරියක් සී / ස රණසිංහ සමාගමෙන් ණයට ගැනීම සටහන් කිරීමට අදාළ මූලාශ්‍ර ලේඛනය හා මූලික සටහන් පොත පිළිවෙලින් දැක්වෙන පිළිතුර වනුයේ,
(1) පොදු ජ'නලය, ජ'නල් වවුචරය (2) ගැණුම් ජ'නලය, ගැණුම් ඉන්වොයිසිය
(3) ජ'නල් වවුචරය, පොදු ජ'නලය (4) ගැණුම් ඉන්වොයිසිය, ගැණුම් ජ'නලය (..........)

37. පහත සඳහන් වැරදි අතුරින් ශේෂ පිරික්සුමේ සමානතාවයට බලපාන වරදක් වනුයේ,
(1) විකුණුම් ඉන්වොයිසික වටිනාකම රු. 19 000 වූ අතර එහි ගිණුම්ගත වී ඇත්තේ රු. 9 000 ක් ලෙසය.
(2) ගැණුම් ඉන්වොයිසියක් සම්පූර්ණයෙන් ගිණුම් පොත්වලින් මඟ හැරී ඇත.
(3) ගොඩනැගිලි කුලී වශයෙන් ගෙවූ රු. 25 000 ගොඩනැගිලි ගිණුමට හර කර ඇත.
(4) ණයහිමියන් ට ගෙවූ රු. 12 000 මුදල් පොතට මෙන්ම ණය හිමි ගිණුමට ද බැර කර ඇත. (..........)

38. ශේෂ පිරික්සුම යනු,
(1) මූලාශ්‍ර ලේඛනයකි. (2) ලේජරයේ ගිණුමකි.
(3) ශේෂ ඇතුළත් ලේඛනයකි. (4) මූලික සටහන් පොතකි. (..........)

- **පහත සඳහන් තොරතුරු ඇසුරින් 39 හා 40 ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**

විශ්වගේ ව්‍යාපාරයේ 2022. 12. 31 දිනට පිළියෙළ කරන ලද ශේෂ පිරික්සුමේ හර ශේෂය රු. 77 200 ක් ද, බැර ශේෂය රු. 74 200 ද විය. මෙම වෙනසට හේතු සෙවීමේ දී හඳුනාගත් වැරදි කීපයක් පහත දැක්වේ.

- ⋆ ව්‍යාපාරයේ විදුලි බිල රු. 12 000 ක් ගෙවීම විදුලි වියදම් ගිණුමේ සටහන්ව ඇත්තේ රු. 1 200 ක් ලෙසය.
- ⋆ රු. 7 000 ක රක්ෂණ ගාස්තු ගෙවීම ගිණුම් පොත්වලින් මඟ හැරී ඇත.

39. ඉහත දැක් වූ ශේෂ පිරික්සුමේ වෙනස අවිනිශ්චිත ගිණුමේ සටහන් කළ යුතු වන්නේ,
(1) රු. 3 000 ක බැර ශේෂයක් ලෙසය. (2) රු. 3 000 ක හර ශේෂයක් ලෙසය.
(3) රු. 77 200 ක හර ශේෂයක් ලෙසය. (4) රු. 77 200 ක බැර ශේෂයක් ලෙසය. (..........)

40. ඉහත සඳහන් කළ වෙනසට හේතුවක් වූ (1) වරද නිවැරදි කිරීමට අදාළ ජ'නල් සටහන නම්,
(1) විදුලි වියදම් ගිණුම හර 1 200
    අවිනිශ්චිත ගිණුම බැර 1 200
(2) අවිනිශ්චිත ගිණුම හර 1 200
    විදුලි වියදම් ගිණුම බැර 1 200
(3) විදුලි වියදම් ගිණුම හර 10 800
    අවිනිශ්චිත ගිණුම බැර 10 800
(4) අවිනිශ්චිත ගිණුම හර 10 800
    විදුලි වියදම් ගිණුම බැර 10 800 (..........)



මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# අවසාන වාර පරීක්ෂණය 2022

**10 ශ්‍රේණිය 60 - ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය (නව නිර්දේශය) - II කාලය පැය 02 යි.**

| නම/ විභාග අංකයඃ |
|---|

<u>වැදගත් :</u>

- **පළමු ප්‍රශ්ණයටත් I කොටසින් ප්‍රශ්න දෙකක්ද,II කොටසින් ප්‍රශ්න දෙකක්ද බැගින් ප්‍රශ්න 05 කට පමණක් පිළිතුරු සපයන්න.**

---

(01) පහත සඳහන් සිද්ධිය අධ්‍යයනය කර දී ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

ජාතික ආධුනිකත්ව හා වෘත්තීය පුහුණු අධිකාරියේ මැහුම් පාඨමාලාවක් හදාරා ඇති චලනි, පියාගෙන් ලද රු. 200, 000 ක් හා රු. 25 000 ක් බැගින් වටිනා මහන මැෂින් යන්ත්‍ර 2 ක් යොදාගෙන 2022 / 1 / 1 දින, කාන්තා ඇඳුම් මසා විකිණීමේ ව්‍යාපාරයක් ආරම්භ කරන ලදී. සේවිකාවකගේ ද සහය ඇතිව නගරයේ පාසල අසල කුලියට ගත් ගොඩනැගිල්ලක ආරම්භ කළ මෙහි නාමය ''සළු රූ'' ලෙස තීරණය කොට ඇත.

මෙම ව්‍යාපාරයේ ජනවාරි මසදී පහත සඳහන් ගනුදෙනු සිදු වී ඇත.

1 / 1 රු. 75 000 ක් යොදා බැංකු ජංගම ගිණුමක් ආරම්භ කිරීම.

1 / 2 රු. 25 000 ක අමුද්‍රව්‍ය මිලට ගැනීම.

1 / 4 රු. 10 000 ක උපකරණ මිලට ගැනීම.

1 / 15 විකුණුම් වලින් රු. 35 000/= ක් ලැබීම.

1 / 20 අමුද්‍රව්‍ය ණයට ගැනුම් රු. 15 000/=

1 / 22 විදුලි බිල ගෙවීම රු. 4 500 /=

1 / 23 සේවක වැටුප් ගෙවීම සඳහා රු. 20 000 /= ත් වටිනා චෙක්පතකින් නිකුත් කිරීම.

1 / 28 විකුණුම් වලින් රු. 25 000 /= ක් ලැබීම.

1 / 29 ගොඩනැගිලි කුලී රු. 15 000 /=

1 / 30 රු. 75 000 /= ක මුදලක් බැංකුවේ තැන්පත් කිරීම.

චලනි 2022 /02 /01 දින දී 6% පොලියට රු. 200, 000 ක බැංකු ණයක් ලබා ගන්නා ලදී.

(i) (අ) ''සළු රූ'' ව්‍යාපාරය සපුරාලන මිනිස් අවශ්‍යතාව කුමක් ද? (ල. 01)

(ආ) ''සළු රූ'' ව්‍යාපාරයේ දක්නට ලැබෙන නිෂ්පාදන සාධක 02 ක් දක්වා උදාහරණ සපයන්න. (ල. 01)

(ii) (අ) මෙම සිද්ධියේ සඳහන් ශක්තියක් හා අවස්ථාවක් දක්වන්න. (ල. 01)

(ආ) ජාතික ආධුනිකත්ව සහ වෘත්තීය පුහුණු අධිකාරිය අයත් වන ව්‍යාපාර සංවිධාන වර්ගය කුමක් ද? (ල. 01)

(iii) (අ) ''සළු රූ'' ව්‍යාපාරය ලියාපදිංචි කළ යුතු ද? (ල. 01)

(ආ) ඔබේ පිළිතුර සඳහා හේතු දක්වන්න. (ල. 01)

(iv) (අ) මෙහි අභ්‍යන්තර පරිසරයට අයත් සංරචකයන් 02 ක් ලියන්න. (ල. 01)

(ආ) මෙම ව්‍යාපාරයේ 'වත්කම් අඩුවීම, වත්කම් වැඩිවීම යන ද්විත්ව බලපෑම දැක්වෙන ගනුදෙනුවක් ලියා දක්වන්න. (ල. 01)

(v) මෙහි ආරම්භක ගිණුම්කරණ සමීකරණය අගයයන් සහිතව ලියා දක්වන්න. (ල. 02)

(vi) (අ) 2022/1/20 ගනුදෙනුවට අදාළ මූලාශ්‍ර ලේඛනය හා මූලික පොත ලියා දක්වන්න. (ල. 01)

(ආ) 2022 /1/20 ගනුදෙනුවට අදාළ ද්විත්ව සටහන ලියා දක්වන්න. (ල. 01)

(vii) 2022/1/31 දිනය ''සළු රූ'' ව්‍යාපාරයේ ගැනුම් ගිණුම දක්වන්න. (ල. 02)

(viii) (අ) 2022/2/1 බැංකු ණය ලබා ගැනීමට අදාළ ද්විත්ව සටහන ලියා දක්වන්න. (ල. 01)

(ආ) එය ගිණුම් ගත කර දක්වන්න. (ල. 01)

(ix) (අ) 2022/1 / 23 ගනුදෙනුවට අදාළ ද්විත්ව සටහන ලියා දක්වන්න. (ල. 01)

(ආ) මෙම ව්‍යාපාරයේ පෙබරවාරි මාසය සඳහා බැංකු ණය පොළිය ගණනය කොට දක්වන්න. (ල. 01)

(x) ''සළු රූ'' ව්‍යාපාරයේ 2022 / 1 / 31 දිනට මුදල් ශේෂය ගණනය කරන්න. (ල. 02)

## I කොටස- ව්‍යාපාර අධ්‍යයනය

(02) (i) (අ) භාණ්ඩ හුවමාරු ක්‍රමය හෙවත් බාටර් ක්‍රමය (Bartar system) පැහැදිලි කරන්න. (ල. 01)

(ආ) ව්‍යාපාරයක් යනු කුමක් ද? (ල. 01)

(ii) පහත දැක්වෙන ප්‍රකාශ සත්‍ය ද, අසත්‍ය ද යන්න දක්වන්න.

(අ) උපතේ සිට මරණය දක්වා මිනිසාට භාණ්ඩ හා සේවා අවශ්‍ය වේ. (.............)

(ආ) ව්‍යාපාරයක් යන්න ආර්ථික කටයුත්තක් නොවේ. (............)

(ඉ) රාජ්‍ය අංශයේ බොහෝ ව්‍යාපාරවල මූලික අරමුණ ලාභය වේ. (............)

(ඊ) වර්තමානයේ දී කිසිවෙක් තමාට අවශ්‍ය සියළුම දෑ නිෂ්පාදනය කර නොගනී. (............)

(ල. ½ x 4 = 02)

(iii) රාජ්‍ය අංශයේ හා පෞද්ගලික අංශයේ ව්‍යාපාර දැකිය හැක. ''මෙම ව්‍යාපාර කටයුතු කරන්නේ ලාභය මත පමණි.'' මෙම ප්‍රකාශය සමඟ ඔබ එකඟ වන්නේ ද? පැහැදිලි කරන්න. (ල. 02)

(iv) සිතුග අත්හුරු ක්‍රමයට තම ප්‍රදේශය තුළ පවත්වාගෙන ගිය දැන්වීම් කලාව පරිගණක හා නව තාක්ෂණය උපයෝගීකර ගෙන ලෝක වෙළඳපොළට තම නිර්මාණ විද්‍යුත් මාධ්‍ය හරහා ඉදිරිපත් කරමින් අලෙවි කළහ.

(අ) සිතුග ගේ ව්‍යාපාරය නිෂ්පාදිතවල ස්වභාවය අනුව කුමන ව්‍යාපාරයක් ද? (ල. 01)

(ආ) මෙම ව්‍යාපාරයට විද්‍යුත් මාධ්‍ය භාවිතා කිරීමේ වාසි 02 ක් ලියන්න. (ල. ½ x 2 = 01)

(03) (i) (අ) ව්‍යාපාර පරිසරය යනු කුමක් ද? (ල. 01)

(ආ) ව්‍යාපාර පරිසරය ප්‍රධාන කොටස් දෙකක් යටතේ වර්ග කරන්න. (ල. ½ x 2 = 01)

(ii) පහත ප්‍රකාශ සත්‍ය ද, අසත්‍ය ද යන්න දක්වන්න.

(අ) ව්‍යාපාර පරිසර බලවේග ශීඝ්‍රයෙන් වෙනස් නොවේ. (...........)

(ආ) ව්‍යාපාරයක පැවැත්ම රඳා පවතින්නේ ගනුදෙනුකරුවන් මතය. (...........)

(ඉ) ඇතැම් ව්‍යාපාරවල අයිතිකරුවෝ ම කළමනාකරුවෝ වෙති. (...........)

(ඊ) සැපයුම්කරුවෝ අභ්‍යන්තර පරිසරයට අයත් වේ. (..........)

(iii) (අ) ව්‍යාපාරයක භාණ්ඩ හා සේවා මිල දී ගන්නෝ ගනුදෙනුකරුවෝ වෙති. ඒ සඳහා ව්‍යාපාර කටයුතු කළ යුත්තේ කෙසේ ද? (ල. 01)

(ආ) තාක්ෂණික වෙනස් වීම් නිසා ව්‍යාපාරවල සිදු වූ වෙනස්කම් වලට නිදසුන් දෙකක් ලියන්න.

(ල. ½ x 2 = 01)

(iv) රට තුළ පවතින ආර්ථික අර්බුදය හමුවේ වෙළඳුන් විසින් තම හිතුමතේට භාණ්ඩ මිල ගණන් වෙනස් කරමින් විවිධ වෙළඳ විෂමාචාර වල යෙදෙමින් ගනුදෙනුකරුවෝ දැඩි අපහසුතාවයට පත්කරන ලදී.

(අ) ඉහත සිදුවීමට අදාළ පාරිභෝගික ආරක්ෂාව සඳහා පැමිණිලි කළ හැකි රාජ්‍ය ආයතනයක් නම් කරන්න. (ල. 01)

(ආ) පාරිභෝගිකයා ආරක්ෂා කිරීම සඳහා ඉහත සිදුවීමට අදාළව කුමන පනතක් ක්‍රියාත්මක කළ හැකි ද? (ල. 01)

(04) (i) ධීවර කර්මාන්තයේ යෙදී සිටින පුද්ගලයන් 10 කු ස්වේඡාවෙන් එකට එකතු වී සාමූහික අයිතියක් ඇති සීමිත වගකීමක් සහිත ව්‍යාපාරයක් ආරම්භ කළේය.

(අ) ඔවුන් විසින් ආරම්භ කළ ව්‍යාපාර සංවිධාන වර්ගය කුමක් ද? (ල. 01)

(ආ) එම සංවිධාන වර්ගය සඳහා ප්‍රධාන වශයෙන් ප්‍රාග්ධනය සැපයෙන්නේ කෙසේ ද? (ල. 01)

(ii) පහත ප්‍රකාශ සත්‍ය ද අසත්‍ය ද යන්න දක්වන්න.

(අ) හවුල් ව්‍යාපාරයක හවුල්කරුවන් මියයාම, බුන්වත්වීම වැනි හේතූන් එහි පැවැත්මට බාධා ඇති කරයි. (...........)

(ආ) අමාත්‍යාංශයක් යටතේ ක්‍රියාත්මක වන මුළුමනින්ම රජයේ ඍජු පාලනයට අයත් වන ආයතන දෙපාර්තමේන්තු වේ. (...........)

(ඇ) හවුල් ව්‍යාපාර ආඥා පනත අනුව එහි අවම හවුල්කරුවන් සංඛ්‍යාව දෙකකි. (............)

(ඈ) තනි පුද්ගල ව්‍යාපාරයක් ලියාපදිංචි කිරීමෙන් නීතිමය පුද්ගලභාවයක් හිමි වේ. (...........)

(ල. ½ x 4 = 02)

(iii) පහත සඳහන් ව්‍යාපාර අයත් ව්‍යාපාර සංවිධාන වර්ගය නම්කරන්න.

(අ) ශ්‍රී ලංකා වරාය අධිකාරිය -

(ආ) අමිත් ස්ටෝර්ස් -

(ඇ) ක්වින්ටස් සහ පුත්‍රයෝ -

(ඈ) සී / ස ගුණවංශ සමාගම - (ල. ½ x 4 = 02)

(iv) සංස්ථාපිත සමාගමක දැකිය හැකි වාසියක් හා අවාසියක් නම් කරන්න. (ල. 02)

## II කොටස- ගිණුම්කරණය

(05) (i) ගිණුම්කරණය යනු කුමක් දැයි හඳුන්වා එහි අරමුණු දෙකක් ලියා දක්වන්න. (ල. 02)

(ii) ව්‍යාපාරයක ඇතිවන ගණුදෙනුවලට අමතරව සිද්ධි 2 ක් සඳහා උදාහරණ දෙකක් සපයන්න.(ල. 02)

(iii) පහත දී ඇති ගිණුම්වලට අදාළ වැඩිවීම හෝ අඩුවීම සටහන් කරන ආකාරය දක්වන්න.

| ගිණුම | වැඩිවීම | අඩුවීම. |
|---|---|---|
| (අ) ගැණුම් ගිණුම | | |
| (ආ) උපකරණ ගිණුම | | |
| (ඇ) ප්‍රාග්ධන ගිණුම | | |
| (ඈ) විදුලි බිල් ගිණුම | | |

(ල. ½ x 4 = 02)

(iv) අමිල විසින් 2022. 01. 01 ආරම්භ කරන ලද ව්‍යාපාරයට අදාළව පළමු සතිය තුළ පහත ගනුදෙනු සිදු විය.

| | | |
|---|---|---|
| (අ) | ආරම්භක ප්‍රාග්ධනය යෙදවීම | රු. 20 000 |
| (ආ) | බැංකු ණය ගැනීම | රු. 50 000 |
| (ඇ) | අනිල්ගෙන් ණයට භාණ්ඩ මිල දී ගැනීම | රු. 10 000 |
| (ඈ) | කුලී මුදලින් ගෙවීම. | රු. 15 000 |

ඉහත ගනුදෙනු පහත ගිණුම්කරණ සමීකරණයෙහි දක්වන්න.

වත්කම් = හිමිකම් + වගකීම් (ල. ½ x 4 = 02)

(v) ව්‍යාපාරයක් විසින් පහත ලෙජර් ගිණුම් පවත්වාගෙන යයි.

(අ) ණයගැති ගිණුම

(ආ) රක්ෂණ ගාස්තු ගිණුම

(ඇ) බැංකු ණය ගිණුම

(ඈ) යන්ත්‍ර ගිණුම

(ඉ) ගැනිලි ගිණුම

(ඊ) ණයහිමි ගිණුම

(උ) වැටුප් ගිණුම

(ඌ) ප්‍රාග්ධන ගිණුම

ඉහත ගිණුම් පහත ශීර්ෂ යටතේ වර්ගකර දක්වන්න.

1. වත්කම් ගිණුම
2. වගකීම් ගිණුම
3. වියදම් ගිණුම
4. හිමිකම් ගිණුම (ල. ½ x 8 = 4)

(06) (i) මුදල් ලැබීමේ ගනුදෙනුවක් හා මුදල් ගෙවීම් ගනුදෙනුවක් ලියන්න. (ල. 02)

(ii) සුපුන්ගේ ව්‍යාපාරයේ 2022 ජූලි මාසයේ මුල් සතියේ සිදු වූ ගනුදෙනු කීපයක් පහත දැක්වේ.

- ⋆ 2022. 07. 01 දිනට මුදල් ශේෂය රු. 91 000 කි.
- ⋆ 2022. 07. 03 දින ව්‍යාපාරයට රු. 100 000 ක බැංකු ණයක් ගැනීම.
- ⋆ 2022. 07. 04 ව්‍යාපාරයේ ණය හිමියෙකු වූ පියල්ට රු. 48 000 ක් ගෙවීම.
- ⋆ 2022. 07. 05 දින ව්‍යාපාරයේ රක්ෂණ ගාස්තු රු. 25 000 ගෙවීම.
- ⋆ 2022. 07. 06 අත්පිට විකුණුම් රු. 50 000 කි

(අ) ඉහත ගනුදෙනු සුපුන්ගේ ව්‍යාපාරයේ මුදල් පොතක සටහන් කරන්න. (ල. 03)

(ආ) මුදල් පොත තුලනය කර මුදල් ශේෂය ගණනය කරන්න. (ල. 01)

(iii) තරිඳුගේ ව්‍යාපාරයට සුදේශ් නම් ණයගැතියාගෙන් ලද රු. 150 000 ක චෙක්පත එදිනම බැංකුවේ තැන්පත් කළ අතර එය අගරු වී ඇති බව බැංකුව තරිඳුට දන්වා ඇත. එම අගරු වීම තරිඳුගේ ව්‍යාපාරයේ සටහන් කිරීමට අදාළ ද්විත්ව සටහන ලියන්න.

(iv) ශශිකලාගේ ව්‍යාපාරයේ සුළු මුදල් අග්‍රිමය රු. 2 500 කි. එය 2022/04/03 දින මුදල් භාරකරුට ලැබී ඇත. 2022 අප්‍රේල් මාසය සඳහා සුළු මුදල් ගෙවීම් පහත දැක්වේ.

| දිනය | පා. අ. | විස්තරය | වටිනාකම් (රු) |
|---|---|---|---|
| 2022. 04. 05 | 001 | ලිපිද්‍රව්‍ය වියදම් | 750 |
| 2022. 04. 10 | 002 | තැපැල් වියදම් | 250 |
| 2022. 04. 17 | 003 | ලිපි ලියාපදිංචි කිරීම | 150 |
| 2022. 04. 25 | 004 | ගමන් වියදම් | 1 000 |

අවශ්‍ය වන්නේ,

ඉහත ගනුදෙනු සුළු මුදල් පොතක සටහන් කර 2022. 04. 30 දිනට සුළු මුදල් පොත තුලනය කිරීම.

(07) (i) පොදු ජ'නලය යනු කුමක් දැයි කෙටියෙන් සඳහන් කරන්න. (ල. 02)

(ii) පහත දැක්වෙන ගනුදෙනු ශේෂ පිරික්ෂුමේ හර තීරුවේ සටහන් කරන ගනුදෙනු හා බැර තීරුවේ සටහන් කරන ගනුදෙනු වශයෙන් වෙන් කර ලියන්න.

(අ) ගැණුම් 100 000

(ආ) ප්‍රාග්ධනය 700 000

(ඉ) මුදල් 150 000

(ඊ) බැංකු ණය පොළිය 10 000 (ල. ½ x 4 = 02)

(iii) 2022. 03. 31 දිනට නදීශානිගේ ව්‍යාපාරයේ බැංකු ගිණුමේ වාසිදායක ශේෂය රු. 40 000 ක් විය. නමුත් එදිනට බැංකුවෙන් ලද බැංකු ප්‍රකාශනයේ ශේෂය ඊට වෙනස් විය. පසුව වෙනසට හේතු සෙවීමේ දී පහත කරුණු අනාවරණය විය.

- ⋆ බැංකුවට සෘජුවම ලැබූ ලාභාංශ රු. 15 000
- ⋆ බැංකුවට සෘජුවම ලැබූ ණයගැති ප්‍රේෂණ 11 000
- ⋆ නදීශානිගේ ජංගම ගිණුමේ සටහන් කළ නමුත් ඉදිරිපත් නොකළ රු. 8 000 ක චෙක්පත (චෙ. අ. 255213)
- ⋆ තැන්පත් කළ නමුත් ඉදිරිපත් නොවූ රු. 14000 චෙක්පත (චෙ. අ. 933411)

අවශ්‍ය වන්නේ,

(අ) බැංකු ගිණුම සංශෝධනය කිරීම. (ල. 02)

(ආ) බැංකු සැසඳුම් ප්‍රකාශය පිළියෙළ කිරීම. (ල. 02)

(iv) රවිඳු මධුෂාන්ගේ ව්‍යාපාරයේ 2022. 03. 31 දිනට සකස් කරන ලද ශේෂ පිරික්සුමේ හර තීරුවේ එකතුව රු. 178 000 ද බැර තීරුවේ එකතුව රු. 188 000 ක් ද විය. එම වෙනසට හේතු කිහිපයක් පහත දැක්වේ.

- ⋆ රු. 2 000 ගෙවල් කුලී වියදම මුදල් පොතට බැර කර ගෙවල් කුලී වියදම ගිණුමට ද බැර කර ඇත.
- ⋆ ණයගැතියන්ගෙන් රු. 6 000ක් ලැබීම ණය ගැති ගිණුමේ දෙවරක් සටහන් කර ඇත.
- ⋆ උපකරණ අලුත්වැඩියාවට වැය කළ රු. 3 000 උපකරණ ගිණුමට හර කර තිබීම.

(අ) ශේෂ පිරික්සුමේ වෙනස අවිනිශ්චිත ගිණුමේ සටහන් කළ යුත්තේ කුමන තීරුවේ ද? (ල. 01)

(ආ) ඉහත වැරදි නිවැරදි කිරීමට අදාළ ජ'නල් සටහන ලියන්න. (ල. 03)

## පිළිතුරු පත්‍රය - I කොටස

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 -(2) | 2 -(3) | 3 -(4) | 4 -(2) | 5 -(4) | 6 -(1) | 7 -(3) | 8 -(1) | 9 -(2) | 10 -(4) |
| 11-(3) | 12 -(4) | 13 -(3) | 14 -(1) | 15 -(2) | 16 -(3) | 17 -(2) | 18 -(3) | 19 -(4) | 20 -(3) |
| 21-(1) | 22 -(2) | 23 -(2) | 24 -(4) | 25 -(4) | 26 -(4) | 27 -(4) | 28 -(3) | 29 -(1) | 30 -(1) |
| 31-(1) | 32 -(2) | 33 -(4) | 34 -(2) | 35 -(3) | 36 -(3) | 37 -(4) | 38 -(3) | 39 -(1) | 40 -(3) |

(නිවැරදි පිළිතුරට ලකුණු 01 බැගින්)

## II පත්‍රය

01. (i) (අ) ඇඳුම් පැළඳුම් (ල. 01)

(ආ) ශ්‍රමය - සේවිකාව
ප්‍රාග්ධනය - රු. 200 000 ක මුදල
රු. 25 000/= බැගින් වටිනා මහන මැෂින් 02
ව්‍යවසාය - චලනි (අයිතිකරු) (ල. 01)

(ii) (අ) ශක්තිය - චලනි ජාතික ආධුනිකත්ව සහ වෘත්තීය පුහුණු අධිකාරියෙන් හදාරා ඇති පාඨමාලාව
අවස්ථාව - ව්‍යාපාරය නගරයේ පාසල අසල පිහිටා තිබීම. (ල. 01)

(ආ) රාජ්‍ය සංස්ථා (ල. 01)

(iii) (අ) ලියාපදිංචි කළ යුතුය. (ල. 01)

(ආ) තනි පුද්ගල ව්‍යාපාරයක් අයිතිකරුගේ සම්පූර්ණ නමින් හැර වෙනත් නමකින් පවත්වාගෙන යන්නේ නම් ව්‍යාපාරයේ නාමය ලියාපදිංචි කළ යුතුය. (ල. 01)

(iv) (අ) සේවකයෝ, අයිතිකරුවන් (චලනි) (ල. 01)

(ආ) රු. 10 000 /= ක උපකරණ මිලට ගැනීම.
රු. 75 000 /= මුදලක් බැංකුවේ තැන්පත් කිරීම. (ල. 01)

(v)

| | | | | |
|---|---|---|---|---|
| වත්කම් | = | හිමිකම් | + | වගකීම් |
| මහන මැෂින් + මුදල් | = | ප්‍රාග්ධනය | + | - |
| 50 000 + 200 000 | = | 250 000 | + | - |

(ල. 02)

(මහන මැෂින් හා මුදල් ලෙස වෙන් කොට දක්වා නොමැතිනම් ල. 01)

(vi) (අ) මූලාශ්‍ර ලේඛණය - ගැනුම් ඉන්වොයිසිය
මූලික පොත - ගැනුම් ජ'නලය (ල. 01)

(ආ) ගැනුම් ගිණුම - හර 15 000
ණය හිමියෝ - බැර 15 000 (ල. 01)

(vii) ගැනුම් ගිණුම

| | |
|---|---|
| 1/2 මුදල් 25 000 | |
| 1/20 ණය හිමියෝ 15 000 | |

(viii) (අ) 2 / 1 මුදල් පොත - හර 200 000
බැංකු ණය ගිනුම - බැර 200 000 (ල. 01)

(ආ) මුදල් පොත

| | |
|---|---|
| 2/1 බැංකු ණය 200, 000 | |

බැංකු ණය

| | |
|---|---|
| | 2/1 මුදල් 200, 000 |

(ix) (අ) සේවක වැටුප් ගිණුම - හර 20 000
බැංකු ගිණුම - බැර 20 000 (ල. 01)

(ආ) $200\ 000 \times \frac{6}{100} \times \frac{1}{12} =$ රු. 1 000 /= (ල. 01)

translate

(x) මුදල් පොත

| | | | | | |
|---|---|---|---|---|---|
| ½ | 1/1 ප්‍රාග්ධනය | 200, 000 | 1/1 බැංකු | 75 000 | ½ |
| ½ | 1/15 විකුණුම් | 35, 000 | 1/2 අමුද්‍රව්‍ය | 25 000 | |
| | 1/28 විකුණුම් | 25, 00 | 1/3 උපකරණ | 10 000 | |
| | | | 1 / 22 විදුලි ගාස්තු | 4 500 | |
| | | | 1/29 ගොඩනැගිලි කුලී | 15 000 | |
| | | | 1/30 බැංකු | 75 000 | |
| | | | 1/31 ප/ගෙ ශේෂය | 55, 500 → | ½ |
| | | 260, 000 | | 260, 000 | |
| | 2/1 ඉ/ ගේ ශේෂය | 55, 500 | | | |

(ල. 02)

## I කොටස

(02) (i) (අ) භාණ්ඩ අතිරික්තය අනෙකුත් පුද්ගලයන් සමග හුවමාරු කර ගනිමින් ඔවුන්ට අවශ්‍ය අනෙකුත් භාණ්ඩ ලබා ගැනීම. (ල. 01)

(ආ) මිනිස් අවශ්‍යතා සපුරාලීමට අවශ්‍ය විවිධ වූ භාන්ඩ හා සේවා නිෂ්පාදනය කිරීම හෝ සැපයීම ආශ්‍රිත ආර්ථික කටයුත්තකි. (ල. 01)

(ii) (අ) සත්‍ය (ආ) අසත්‍ය (ඉ) අසත්‍ය (ඊ) සත්‍ය (ල. ½ x 4 = 02)

(iii) (අ) එකඟ නොවේ. (ල. 01)

(ආ) පෞද්ගලික අංශයේ බොහෝ ව්‍යාපාර ලාභ අපේක්ෂාවෙන් කටයුතු කළ ද රාජ්‍ය අංශයේ බොහෝ ව්‍යාපාර කටයුතු කරන්නේ සුභසාධන අපේක්ෂාවෙන් (ල. 01)

(iv) (අ) සේවා සැපයීමේ ව්‍යාපාර (ල. 01)

(ආ) භාණ්ඩ හා ඇණවුම් කිරීම / මුදල් ගෙවීම / ප්‍රචාරණය (සුදුසු පිළිතුරකට) (ල. ½ x 2 = 01)

(03) (i) (අ) ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යාමේ දී ඊට බලපෑම් ඇතිකරන විවිධ සාධක ක්‍රියාත්මක වන වටපිටාව ව්‍යාපාර පරිසරයයි. (ල. 01)

(ආ) අභ්‍යන්තර පරිසරය/ බාහිර පරිසරය (ල. ½ x 2 = 01)

(ii) (ආ) අසත්‍ය (ආ) සත්‍ය (ඉ) සත්‍ය (ඊ) අසත්‍ය (ල. ¼ x 4 = 02)

(iii) (අ) ගනුදෙනුකරුවන්ගේ අවශ්‍යතා සහ වුවමනා හඳුනාගනිමින් ඒවා නිසි පරිදි ඉටු කිරීම මගින්. (ල. 01)

(ආ) සාමාන්‍ය තැපැල වෙනුවට දුරකථන, විද්‍යුත් තැපැල පොත්වල ගිණුම් තැබීම වෙනුවය පරිඝණක පද්ධති භාවිතය මිනිස් ශ්‍රමය වෙනුවට පරිගණකගත කළ යන්ත්‍ර සූත්‍ර (ල. ½ x 2 = 01)

(iv) (අ) පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය. (ල. 01)

(ආ) 2003 අංක 09 දරණ පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරි පනත (ල. 01)

(04) (i) (ආ) සමුපකාර සමිතියකි.

(ආ) සාමාජික අරමුදලෙනි.

(ii) (අ) ✓ (ආ) ✓ (ඇ) × (ඈ) ×

(iii) (අ) රාජ්‍ය සංස්ථා (ආ) කේවල ස්වාමී ව්‍යාපාර (ඇ) හවුල් ව්‍යාපාර (ඈ) සී / ස සමාගම්

(iv) වාසි - විශාල ප්‍රාග්ධනයක් රැස් කිරීම / නීතිමය පුද්ගල භාවය / අඛණ්ඩ පැවැත්ම / වගකීම සීමිත වීම.
අවාසි - නීතිමය බලපෑම වැඩි වීම / ආරම්භ පහසු නොවීම

translate

(05) (i) ඇල්මැති පාර්ශවයන්ට තීරණ ගැනීම සඳහා තොරතුරු සැපයීමේ ක්‍රියාවලිය වේ. (ල. 02)

අරමුණු -
- ★ ලාභ හෝ අලාභය තීරණය කිරීම.
- ★ නීතිමය අවශ්‍යතා සම්පූර්ණ කිරීම.
- ★ වැරදි හා වංචා අවම වීම.

(ii) රු. 50 000 ක භාණ්ඩ තොගයක් විනාශ වීම.
රු. 23 000 ක ණයගැතියෙකු බංකලොත් වීම. (ල. 02)

(iii) (අ) හර, බැර (ආ) හර බැර (ඇ) හර, බැර (ඈ) හර බර (ල.½ x4 =2)

(iv)

| | වත්කම් | = | හිමිකම් | + | වගකීම් |
|---|---|---|---|---|---|
| (අ) | + 20 000 | = | + 20 000 | | |
| (ආ) | + 50 000 | = | + | + | 50 000 |
| (ඇ) | + 10 000 | = | + | + | 10 000 |
| (ඈ) | + 15 000 | = | + 15 000 | | |

(ල.½ x4 =2)

(v) (අ) වත්කම් (ආ) වියදම් (ඇ) වගකීම්
(ඈ) වත්කම (ඉ) හිමිකම් (ඊ) වගකීම් (උ) වියදම්
(ඌ) හිමිකම් (ල.½ x8 =4)

(06) (i) නිවැරදි ගණුදෙනු දෙක සඳහා ලකුණු ලබා දෙන්න. (ල. 02)

(ii) (අ)

මුදල් පොත

| දිනය | | විස්තරය | | වටිනාකම | දිනය | විස්තරය | | වටිනාකම |
|---|---|---|---|---|---|---|---|---|
| 7/1 | | ඉ/ගි ශේෂය | | 91 000 | 7/4 | ණය හිමි (පියල්) | | 48 000 |
| 7/3 | | බැංකුණය ගි. | | 100 000 | 7/5 | රක්‍ෂණ ගාස්තු | | 25 000 |
| 7/6 | | විකුණුම් ගිණුම | | 50 000 | | | | |
| | | | | | 7/7 | ශේෂය ප/ගෙ | | 168 000 |
| | | | | 241 000 | | | | 241 000 |
| 7/8 | | ශේෂය ඉ/ගෙ | | 168 000 | | | | |

(ල. 03)

(ආ) රු. 168 000 (ල. 01)

(iii) ණය ගැති ගිණුම හර 150 000
බැංකු ගිණුම බැර 150 000 (ල. 02)

(iv)

සුළු මුදල් පොත

| ලැබීම් රු. | ස පි | දිනය | විස්තරය | ව අ | ගෙවීම් | විශ්ලේෂණය | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | ලිපිද්‍රව්‍ය | තැපැල් | ගමන් | | |
| 2 500 | | 4 /1 | මුදල් | 001 | 750 | 750 | | | | |
| | | 4 / 5 | ලිපිද්‍රව්‍ය වි. | 002 | 250 | | 250 | | | |
| | | 4 / 10 | තැපැල් වි. | 003 | 150 | | 150 | | | |
| | | 4 /17 | ලිපි ලියාපදිංචි කි. | 004 | 1 000 | | | 1 000 | | |
| | | 4 /25 | ගමන් වියදම | | | | | | | |
| | | | | | 2 150 | 750 | 400 | 1 000 | | |
| | | 4 / 30 | ශේෂය ප/ගෙ | | 350 | | | | | |
| 2 500 | | | | | 2 500 | | | | | |
| 350 | | 5 /1 | ශේෂය ඊ/ගෙ | | | | | | | |

(ල. 04)

(07) (i) අනෙකුත් උපයෝගී පොත්වල සටහන් නොවන ගනුදෙනු මුලින්ම සටහන් කරන පොත පොදු ජ'නලය වේ. (ල. 02)

translate

(ii)

සංශෝධිත බැංකු ගිණුම

(අ)

| | | | | |
|---|---|---|---|---|
| 5/21 | ශේෂය | 40 000 ½ | | |
| | ලාභාංශ | 15 000 ½ | | |
| | ණයගැති ප්‍රේෂණ | 11 000 ½ | ප/ගෙ ශේ | 66 000 ½ |
| | | 66 000 | | 66 000 |
| | ඉ/ගෙ ශේෂය | 66 000 | | |

(ල. 02)

බැංකු සැසඳුම් ප්‍රකාශය

(ආ)

| | | | |
|---|---|---|---|
| | සංශෝධිත බැංකු ශේෂය | | 66 000 ½ |
| (එකතු කළා) | නිකුත් කළ නමුත් ගෙවීමට ඉදිරිපත් නොවූ 255213 දරණ චෙක්පත | | 8 000 ½ |
| | | | 74 000 |
| (අඩු කළා) | තැන්පත් කළ නමුත් විෂ්කාශනය නොවූ 933411 දරණ චෙක්පත | | (14 000) ½ |
| 2023/3/31 | බැංකු ප්‍රකාශන අනුව ශේෂය | | 60 000 ½ |

(ල. 02)

(iv) (අ) හර තීරුවේ (ල. 01)

(ආ)

| | | |
|---|---|---|
| ගෙවල් කුලී ගිණුම<br>අවිනිශ්චිත ගිණුම<br>(ගෙවූ ගෙවල් කුලී 2 000 ගෙවල් කුලී ගිණුමට බැරකිරීමෙන් වූ වරද නිවැර දි කිරීම) | 4 000 | 4 000 |
| ණයගැති ගිණුම<br>අවිනිශ්චිත ගිණුම<br>(ණයගැතියන්ගෙන් ලද රු. 6 000 ණයගැති ගිණුමේ දෙවරක් සටහන් වීමෙන් වූ වරද නිවැරදි කිරීම) | 6 000 | 6 000 |
| උපකරණ අලුත්වැඩියා ගිණුම<br>උපකරණ ගිණුම<br>උපකරණ අලුත්වැඩියාවට වැය කළ රු. 3 000 උපකරණ ගිණුමේ සටහන් කිරීමෙන් වූ වරද නිවැරදි කිරීම | 3 000 | 3 000 |

(ලකුණු 03)